# ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව.
## VII සභා වාරය හැට එක්වන මාසික සභා රැස්වීම් වාර්තාව.

ස්ථානය : ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව.
දිනය : 2023.03.14.
වේලාව : පෙ.ව. 10.00.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී ගරු සභාපති එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදි.

මෙදින සහභාගීත්වය:

01. ගරු සභාපති - එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමා.
02. ගරු උප සභාපති - එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා.
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ. ආර් ජයානන්ද මැතිතුමා.
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, - ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා.
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා.
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, - පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා.
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, - එම්.එම්. අමිල සමන් ගුණසේකර මැතිතුමා.
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඩබ්. නිරංජලා විජේසිංහ මැතිතුමිය.
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා.
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ගුරුගේ චන්ද්‍රපාල මැතිතුමා.
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, - දෙවටගේ ධර්මදාස මැතිතුමා.
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, - ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා.
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා.
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා.
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය.
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා.
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා.
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - ඒ.පී. එමරෙන්සියා මේරි මැතිතුමිය.
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, - කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා.
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - මුනියන්ඩි මල්ලිකා දේවි මැතිතුමිය.
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, - එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි. ඇන්ටනී ප්‍රගාස් මැතිතුමා.
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, - ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා.

මෙදින සහභාගී නොවූ මන්ත්‍රීවරුන්:

01.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, - ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා.

නිලධාරි සහභාගීත්වය:

01. ලේකම් - ඩී.ඒ.සී.ආර්. දසනායක මිය.
02. සංවර්ධන නිලධාරි - එම්. ජී. ශකිලා දිනිති තිලකරත්න මිය.
03. සංවර්ධන නිලධාරි - ඊ.කේ.ඒල්.ඒස්. ශිරෝමනී මිය.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ VII සභා වාරයේ හැටඑක්වන සභාව සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරි මහත්ම මහත්මීන් සහ මාධ්‍යවේදී මහතුන් ඇතුළු සියලු දෙනා ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදි. පෙ.ව. 10.00 ට සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## (01). පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම.

ගරු සභාපතිතුමා විසින් 2023.02.14. වන දින පැවැති මහ සභාවේ සභා වාර්තාව සභාගත කරමින් එම වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසට ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා විසින් 2023.02.14. වන දින පැවැති සභාවේ සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කල අතර, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2023.02.14. වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ සභා වාර්තාව සංශෝධන රහිතව යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

## (02). ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,

(i). ඉඹුල්පේ ප්‍රාදේශීය සභා පෙර පාසල් උත්සවය 2023/03/17 වන දින පෙ.ව. 9.00 ට පැවැත්වෙන බැවින් එම අවස්ථාවට සහභාගී වන ලෙසට සියලුම මන්ත්‍රීවරුන්ට හා මන්ත්‍රීවරියන්ට කාරුණිකව ආරාධනය කරමි.

(ii). හත්වන සභා වාරයේ අවසන් මහ සභා රැස්වීම අද දිනට යෙදී ඇති බැවින් සියලුම මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වයෙන් සමූහ ඡයාරූපයක් ලබාගැනිමට අවස්ථාව සකසා ඇති බැවින් ඒ සඳහා සියලුම දෙනා සභාගර්භය තුල රැඳී සිටින ලෙසට ආරාධනය කරමි.

## (03). මාසික මහ සභාවට ලැබී ඇති ලිපි පෙත්සම් සංදේශ හා සන්නිවේදන ඉදිරිපත් කිරීම.

(i). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට අයත් ගලගම බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉදිකරන ලද සූර්යබල සැපයුම් පද්ධතිය වෙනුවෙන් ආදායම බැංකු ගතකිරීම සඳහා සභාව විසින් 0002247364 ගිණුම් අංකය ලංකා විදුලි බල මණ්ඩලය වෙත ලබා දී ඇති අතර ඒම ගිණුම් අංකයට මුදල් බැර වී ඇතත් එය වැරදි ගිණුම් අංකයක් බැවින්, නැවත වාරයක් ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව විසින් ගිණුම් අංකය 0002247304 ලෙසට නිවැරදි විය යුතු බවට, ලංකා විදුලි බල මණ්ඩලයේ කහවත්ත සහ රත්නපුර ප්‍රාදේශීය කාර්යාල වෙත දන්වා යැවීමත් සමඟ, වැරදි ගිණුමට බැර කර ඇති රු. 318,818.94 ක මුදල නිවැරදි ගිණුම් අංකයට බැරකර දෙන ලෙසට ලංකා බැංකු කළමනාකරු වෙත දන්වා යවා ඇති බවට ලංකා විදුලි බල මණ්ඩලයේ ගණකාධිකාරී ආදායම් (සබරගමුව), ඩබ්. එ. එන්.යූ. විජේසූරිය මහතා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

අනතුරුව, ගරු සභාපතිතුමා නැවතත් ඒ සම්බන්ධයෙන් අදහස් දක්වමින්,<br>
2022/09/02 – 91,920.50<br>
2022/10/27 – 71,941.70<br>
2022/11/24 – 45,331.70<br>
2022/12/19 – 60,965.00<br>
2023/02/22 – 48,660.04 වශයෙන් මුළු වටිනාකම රු. 318,818.94 ක මුදලකි. ගිණුම් අංකයේ වැරදීමක් හේතුවෙන් මෙම මුදල වෙනත් ගිණුමකට බැර වී ඇති හෙයින්, එම මුදල් නිවැරදි ගිණුම් අංකයට බැර කරවා දෙන ලෙසට දැනුම් දී ඇති බව සභාවට දන්වා එවා ඇති බව ප්‍රකාශ කරන ලදී.

(ii). හිමිකරුවන් නොමැතිව නිදැල්ලේ මාර්ගවල සැරිසරණ ගවයින් ලබා ගැනීම සම්බන්ධයෙන් ආචාර්ය පූජ්‍ය ඔමල්පේ සෝභිත හිමියන් විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

අනතුරුව, ගරු සභාපතිතුමා නැවතත් ඒ සම්බන්ධයෙන් අදහස් දක්වමින්,
හිමිකරුවන් නොමැතිව නිදැල්ලේ මාර්ගවල සැරිසරණ ගවයන්ගෙන් මහජනතාවට හානි සිදුවීම, ජනතාවට පීඩාකාරී වීම, මස් පිණිස ගවයන් විකිණීම වැනි විවිධ හේතූන් නිසා සතුන් හා සොභාදහම සඳහා යුක්තිය සංවිධානයේ ඉල්ලීම පරිදි රැක බලා ගැනීම සඳහා ගවයන් ලබා දෙන ලෙසට ඔ්මල්පේ සෝභිත හිමියන්ගෙන් ඉල්ලීමක් කර තිබෙනවා. ඔවුන් විසින් රොෂාන් විජිත කුමාර නමින් ඉල්ලුම්කරුවෙකු හඳුන්වා දී ඇති බැවින්, ඉල්ලුම්කරුට ගවයින් ලබා දීමේ වැඩපිළිවෙලට සහයෝගය ලබාදීමට කටයුතු කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා අදහස් දක්වමින්,
පඹහින්න ප්‍රදේශයේ ආයාලේ මහමඟ සැරිසරණ ගව ප්‍රශ්නය විසඳීමට වැඩසටහනක් ක්‍රියාත්මක කල අවස්ථාවේ දී ඉල්ලුම්කරු විසින් ගැහැණු සතුන් පමණක් ඉල්ලුම් කල බැවින්, ප්‍රදේශවාසීන් කිහිප දෙනෙකුගේ විරුද්ධතාවය මැද වුවද ගැහැණු සතුන් ලබා දීම නිසා පිරිමි සතුන් ඉතිරි වූ අතර, පෘෂ්ඨීමත්ව සිටි එම පිරිමි සතුන් කිහිපදෙනෙක් වර්තමානය වන විට අතුරුදහන් වෙලා. අයිතිකරුවන්ට තම වතුවල ගවයන් බැඳ තබා ගන්නා ලෙසට දැනුම් දීමට පියවර ගත්තත් එය සිදු නොවන බැවින්, පඹහින්න ප්‍රදේශයේ හිමිකරුවන් නොමැතිව අයාලේ සැරිසරණ ගව ප්‍රශ්නය විසඳාලීමට විශේෂ කාර්ය බලකාය හා සම්බන්ධ වෙමින් අවශ්‍ය පියවර ගනිමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා අදහස් දක්වමින්,
අයාලේ සැරිසරණ ගවයන් විධිමත් පරිදි රැකබලා ගැනීම සඳහා ප්‍රදේශවාසීන්ට ලබා දුන්නත් රැක බලා ගැනීමකින් තොරව යළිත් මහ මඟ සැරි සැරීමට මුදා හරිනු ලැබේ. එබැවින්, මෙම ප්‍රශ්නයට විසඳුමක් අවශ්‍ය බැවින් ඉල්ලුම් කරන ලද ආයතනයට හෝ ප්‍රදේශයේ ඉල්ලුම්කරුවන්ට ලබා දීම සුදුසුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින්,
හිමිකරුවන් නොමැතිව අයාලේ මහමඟ සැරිසරණ ගවයන් ඔමල්පේ සෝභිත හිමියන්ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන වැඩසටහන මඟින් ඉල්ලුම්කරුවන්ට ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා අදහස් දක්වමින්,
හිමිකරුවන් නොමැතිව අයාලේ මහමඟ සැරිසරණ ගවයන් රැකබලාගැනීමට අවධානය යොමු කරමින් ගොවිපලක් පවත්වාගැනීමට වැඩ පිළිවෙලක් සකස් කිරීමෙන් සභාවටද ආදායමක් උපයාගැනීමට හැකිවෙයි.

අනතුරුව, ගරු සභාපතිතුමා නැවතත් ඒ සම්බන්ධයෙන් අදහස් දක්වමින්,
අයාලේ සැරිසරණ ගවයන් රැක බලා ගැනීමේ දී භාවිතයට ගැනීම සඳහා සුදුසු ඉඩම් කොටසක් ලබා දෙන ලෙසට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට යෝජනා ඉදිරිපත් කළා. එහිදී සමනල වැවට යට වූ භූමියෙන් හෝ අක්කර විස්සක පමණ ජලය සහිත භූමියක් ග්‍රාම නිලධාරි උපදෙස් පරිදි ලබා දෙන ලෙසට ඉල්ලීම් කළා. එහෙත් අක්කර ¼ ක ඉඩම් ප්‍රමාණයක්වත් ලැබුණේ නැහැ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දක්වමින්,
අයාලේ සැරිසරණ ගවයන් නිසා පමණක් නොව අයාලේ සැරිසරණ සුනඛයන් ද ජන ජීවිතයට විශාල ප්‍රශ්නයක්. මේ සඳහා සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට සූදානම් වූ අවස්ථාවල්වලදී සත්ත්ව සංවිධාන යැයි කියාගන්නා සංවිධාන විසින් හෝ සතුන්ට ආදරෙයි යැයි කියන කණ්ඩායම් විසින් විරෝධතා ඉදිරිපත් කරනවා. එම සංවිධාන විසින් මෙවැනි සතුන් වෙනුවෙන් මෙම සංවිධාන විසින් සිදු කල ක්‍රියාවන් පිළිබඳව වාර්තාවක් තබා ගැනීම සුදුසුයි. අයාලේ සැරිසරණ ගවයන්ට හිමිකරුවන් සිටියත් රිය අනතුරු අවස්ථාවල්වලදී අයිතිකරුවන් ඉදිරිපත් වන්නේ නැහැ.

අනතුරුව, ගරු සභාපතිතුමා නැවතත් ඒ සම්බන්ධයෙන් අදහස් දක්වමින්,

මෙවැනි ක්‍රියාවන් වලට විරෝධතා දක්වන්නේ පූර්ව දැනුම් දීමකින් තොරවයි. විශේෂ කාර්ය සේවා බලකායේ අධීක්ෂණය යටතේ මෙම කටයුතු සිදු වන අතර බල්ලන් අල්ලන ක්‍රියාවලියේ දී බලංගොඩ උසාවියේ නඩු කටයුත්තක් ද සභාව වෙනුවෙන් පැවැත්වෙන බවට ප්‍රකාශ කරන ලදී.
එම ප්‍රකාශයත් සමඟ බල්ලන් නිසා නොව ගවයන් ඇල්ලීමට ගොස් නඩු කටයුත්තක් පවතින බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් එය නිවැරදි කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය අදහස් දක්වමින්,
පාසල් දරුවන්, පාසල් අසල යතුරු පැදි අනතුරට පත් වීම නිසා අසරණ භාවයට පත් වෙලා. මේ නිසා ජීවිත පවා අහිමිවීමට ඉඩ ඇති බැවින්, අයාලේ සැරිසරණ ගවයන් පිළිබඳව යහපත් තින්දු තීරණ ගැනීමේ දී අවශ්‍ය සහයෝගය ලබා දිය යුතුයි.

අනතුරුව, ගරු සභාපතිතුමා නැවතත් ඒ සම්බන්ධයෙන් අදහස් දක්වමින්,
විරෝධතා නොමැති බැවින් මෙම තීන්දුව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමු.

## (04). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.
කිසිවක් ඉදිරිපත් වී නැත.

## (05). යථා පරිදි කල් දී ඇති යෝජනා.
(i). ප්‍රාදේශීය සභාවේ කාර්යාල නිලධාරින්ගේ ධාරිතා සංවර්ධනය ඉහල නැංවීමේ අරමුණින් 2023 වර්ෂය සඳහා පුහුණු වැඩසටහනක් වශයෙන් කාර්යාල ක්‍රම හා ගිණුම් ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීම සඳහා පුහුණු වැඩමුළු සහ සම්මන්ත්‍රණ වලට අදාළ අනුමත දිමනා සහ රේටයන් වලට අදාලව සකසන ලද වියදම් ඇස්තමේන්තුව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

සභා අරමුදලින් පුහුණු වැඩසටහන පැවැත්වීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමින්,
සභා අරමුදලින් වියදම් දරා පුහුණු වීම් ලබා දීමෙන් අනතුරුව, එම නිලධාරීන් ස්ථාන මාරුවීම් ලැබීමෙන් සභාවට අවශ්‍ය සේවා සපයා ගැනීම ගැටළුවකි.

අනතුරුව, ගරු සභාපතිතුමා නැවතත් ඒ සම්බන්ධයෙන් අදහස් දක්වමින්,
සේවා අවශ්‍යතා අනුව මාරුවීම් සිදු වෙනවා. පළාත් පාලන ආයතන සඳහා මාරුවීම් ලැබෙන්නේ බොහෝවිට එම ආයතන අතර පමණයි.

ඒ අනුව, ප්‍රාදේශීය සභාවේ කාර්යාල නිලධාරින් හට 2023 වර්ෂය සඳහා කාර්යාල ක්‍රම හා ගිණුම් ක්‍රම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම හා ඒ සඳහා පුහුණු වැඩමුළු හා සම්මන්ත්‍රණ වලට අදාළ අනුමත දිමනා සහ රේටයන් වලට අදාලව සකසන ලද වියදම් ඇස්තමේන්තුව අනුමත කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ii). ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි පහන්තුඩා ඇල්ල සංචාරක ස්ථානයේ අනතුරුදායක බව හේතුවෙන් එම ස්ථානයට පැමිණෙන සංචාරකයින් දියේ ගිලී මිය යන අවස්ථා වාර්තා වන බැවින් ආරක්ෂිත වැටක් ඉදිකරවා දෙන ලෙසට සංචාරකයින් විසින් ඉල්ලීම් කර තිබෙන බැවිනුත් එම ස්ථානය නැරඹීමට පැමිණෙන සංචාරකයින්ගේ ජීවිත ආරක්ෂාව සැපයීම සභාවේ වගකීමක් වන බැවින් මෙම ස්ථානයේ ආරක්ෂක වැටක් ඉදිකිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

කොන්ක්‍රීට් අත්වැටක් හෝ කම්බි පාලමක් ඉදිකර දෙන ලෙසට සංචාරක අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කළා. එම ස්ථානයේ ආකර්ශණීය බව ආරක්ෂා වන පරිදි, එල්ලෙන පාලමක් ඉදි කිරීමට සාකච්ඡා කළ බව ප්‍රකාශ කරන ලදී. කොන්ක්‍රීට් ගල් යොදා අත්වැටක් සහිතව කම්බි පාලමක් සාදා දෙන ලෙසට සංචාරක අමාත්‍යාංශ ලේකම්ට හා ආණ්ඩුකාරතුමාට දන්වා යැවීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව, කොන්ක්‍රීට් ගල් යොදා අත්වැටක් සහිතව කම්බි පාලමක් සාදා දෙන ලෙසට සංචාරක අමාත්‍යාංශ ලේකම්ට හා ආණ්ඩුකාරතුමාට දන්වා යැවීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

(iii). 2002,2003,2005,2006 සහ 2009,2010 වර්ෂ සඳහා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව මඟින් සිදු කල කර්මාන්ත හා වෙනත් සේවාවන් සඳහා ලබා දී ඇති අත්තිකාරම් 3070431.34 ක මුදලක් අත්තිකාරම් ලේඛනයේ වසරින් වසර ශේෂ වී නොපියවූ අත්තිකාරම් වශයෙන් පවතින බැවින් විගණන විමසුම් ගණනාවක් ඉදිරිපත්ව ඇති අතර, මෙම අත්තිකාරම් මුදල් පියවා ඇති නමුත් නිසි පරිදි ලේඛන වල ඇතුලත් නොවීම නිසා මෙම ශේෂයන් ඉදිරියට රැගෙනවිත් ඇති බව අනුමාන කළ හැකි බවත්, මෙම නොපියවූ අත්තිකාරම් ලෙස සටහන් වී ඇති මුදල් ලේඛනවලින් ඉවත් කිරිමට සහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරමින් මෙහි සී/ස විවිධ සේවා සමූපාකාර සමිතිය ඉන්ධන පිරවුම්හලෙන් ඉන්ධන ලබා ගැනීම සම්බන්ධයෙන් පවතින රු. 75000/- ක මුදල හැර අනෙකුත් නොපියවූ අත්තිකාරම් මුදල් කපා හැරීමට සහා අනුමැතිය ලබා දෙන ලෙසට ප්‍රකාශ කරන ලදී.

විගණන ගැටළුවක් ඇති නොවන්නේනම් සී/ස විවිධ සේවා සමූපාකාර සමිතිය ඉන්ධන පිරවුම්හලෙන් ඉන්ධන ලබා ගැනීම සම්බන්ධයෙන් පවතින රු. 75000/- ක මුදල හැර, 2002,2003,2005,2006 සහ 2009,2010 වර්ෂ සඳහා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව මඟින් සිදු කල කර්මාන්ත හා වෙනත් සේවාවන් සඳහා ලබා දී ඇති අත්තිකාරම් 3070431.34 ක මුදල කපා හැරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව, විගණන ගැටළුවක් ඇති නොවන්නේනම් සී/ස විවිධ සේවා සමූපාකාර සමිතිය ඉන්ධන පිරවුම්හලෙන් ඉන්ධන ලබා ගැනීම සම්බන්ධයෙන් පවතින රු. 75000/- ක මුදල හැර, 2002,2003,2005,2006 සහ 2009,2010 වර්ෂ සඳහා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව මඟින් සිදු කල කර්මාන්ත හා වෙනත් සේවාවන් සඳහා ලබා දී ඇති අත්තිකාරම් 3070431.34 ක මුදල කපා හැරිමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

(iv). ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නිවාස හා නගර සංවර්ධන ආඥා පනත ක්‍රියාත්මක වන ප්‍රදේශයක ඉඩම් සැලසුම්, ඉඩම් අනුබෙදුම් සැලසුම් හා ගොඩනැගිලි සැලසුම් පරික්ෂා කිරීම, අනුමත කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සබරගමුව පළාතේ පළාත් පාලන කොමසාරිස්, එල්. එම්.පී.ඩබ්. බණ්ඩාර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

අනතුරුව, ඒ සම්බන්ධයෙන් නැවතත් ගරු සභාපතිතුමා විසින් අදහස් දක්වමින්,

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව තුල මෙතෙක් බලාත්මකව පැවැති " අංක 2161 දරණ 2020 ජනවාරි මස 31 වැනි සිකුරාදා දිනැති ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඉඩම් අනු බෙදුම් කිරීම පරිපාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව" සහ "අංක 2161 දරණ 2020 ජනවාරි මස 31 වැනි සිකුරාදා දිනැති ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ ඉඩම් අනු බෙදුම් සැලසුම් හා ගොඩනැගිලි ඉදිකිරිම් සැලසුම් පරීක්ෂා කිරිම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව" පරිච්ඡින්න කිරිමට සහ "ඉඩම් සැලසුම් ඉඩම් අනුබෙදුම් සැලසුම් හා ගොඩනැගිලි සැලසුම් පරීක්ෂා කිරීම, අනුමත කිරිම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව" 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය ප්‍රකාරව සහා අනුමැතිය ලබා ගැනීමට අවශ්‍යාව ඇති බව ප්‍රකාශ කරන ලදී.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව තුල මෙතෙක් බලාත්මකව පැවැති "අංක 2161 දරණ 2020 ජනවාරි මස 31 වැනි සිකුරාදා දිනැති ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඉඩම් අනු බෙදුම් කිරීම පරිපාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව" සහ "අංක 2161 දරණ 2020 ජනවාරි මස 31 වැනි සිකුරාදා දිනැති ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ ඉඩම් අනු බෙදුම් සැලසුම් හා ගොඩනැගිලි ඉදිකිරීම් සැලසුම් පරීක්ෂා කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව" පරිච්ඡින්න කිරිමට සහ "ඉඩම් සැලසුම් ඉඩම් අනුබෙදුම් සැලසුම් හා ගොඩනැගිලි සැලසුම් පරීක්ෂා කිරීම, අනුමත කිරිම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව" බලාත්මක කරවා ගැනීමට 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය ප්‍රකාරව සභා අනුමැතිය ලබා දීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව, ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව තුල මෙතෙක් බලාත්මකව පැවැති "අංක 2161 දරණ 2020 ජනවාරි මස 31 වැනි සිකුරාදා දිනැති ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඉඩම් අනු බෙදුම් කිරීම පරිපාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව" සහ "අංක 2161 දරණ 2020 ජනවාරි මස 31 වැනි සිකුරාදා දිනැති ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ ඉඩම් අනු බෙදුම් සැලසුම් හා ගොඩනැගිලි ඉදිකිරීම් සැලසුම් පරීක්ෂා කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව" පරිච්ඡින්න කිරිමට සහ "ඉඩම් සැලසුම් ඉඩම් අනුබෙදුම් සැලසුම් හා ගොඩනැගිලි සැලසුම් පරීක්ෂා කිරීම, අනුමත කිරිම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව" බලාත්මක කරවා ගැනීමට 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය ප්‍රකාරව සභා අනුමැතිය ලබා දීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (06). කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.

### (06). (i). ගෙවීම අනුමත කිරීම.

මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද පෙබරවාරි මස 01 වන දින සිට පෙබරවාරි මස 25 වන දින දක්වා ගෙවීම් කරන ලද අනු අංක 1 - 86 සහ වවුචර් අංක 51 - 138 දක්වා ගෙවීම් විස්තර වාර්තා සහ වවුචර් උපලේඛන, මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, මුදල් කමිටුවේ අනුමැතිය ලත් එම වවුචර් උපලේඛන හා මුදල් කමිටු වාර්තාව මහ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමින් එම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් මුදල් කමිටුවේ නිර්දේශ ලද වවුචර් වාර්තා සහ මුදල් කමිටු වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව, මුදල් කමිටුවේ අනුමැතිය ලත් වවුචර් උපලේඛන හා මුදල් කමිටු වාර්තාව අනුමත කිරීමේ එම යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (07). ආදායම් වියදම් වාර්තාව.

2023 වර්ෂයේ පෙබරවාරි මස ආදායම් වියදම් වාර්තාව මහ සභාවේ දැන ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

## (08). වෙනත් කරුණු.

(i). නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම.
අසනීප වී ඇති බැවින්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා අද දින මාසික මහ සභාවට නොපැමිණෙන බව, දුරකතනයෙන් දැනුම් දී ඇති බැවින් එතුමාගේ නිවාඩු අනුමත කර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

අසනීප වී ඇති බැවින්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා විසින් එම යෝජනාව කරන ලදී. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ජ්. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව, අසනීප වී ඇති බැවින්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමාගේ නිවාඩු අනුමත කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින්,
සමෘද්ධි බැංකු ශාඛා මඟින් වැඩිහිටි දීමනාව ලබා දිමට සැලසුම් කර ඇති බව දැනගැනීමට ලැබුණා. මේ නිසා වැඩිහිටියන් දැඩි අපහුතාවයට පත්වන බැවින් නැවතත් තැපැල් කාර්යාලය ඔස්සේ එම දීමනාව ලබා දීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට අදාල ආයතන වෙත දන්වා යවමු. නව මන්ත්‍රීවරයෙක් ලෙස සභාව නියෝජනය කල අවස්ථාවේ සිට අවසානය දක්වා ගරු සභාපතිතුමා ලේකම්තුමිය දැක්වූ සහයෝගයට විශේෂ ස්තුතිය පිරිනමමි.

(iii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමින්,
සම්මාදම් ව්‍යාපාරවල යෙදෙන්නන් දරුවෙක් අසනීප වී ඇති බව, ළමා නිවාස සඳහා, දානමය පිංකම් කටයුතු සඳහා ආධාර එකතු කරන බව පවසමින් මුදල් එකතු කරනවා. එක් දිනක් පිටකොටුවෙන් බස් රථයට ගොඩ වී අනුරාධපුරයට ගමන් කිරීමට අවශ්‍ය බව පවසමින් මුදල් එකතු කර ගන්නා ලදී. මාස දෙක තුනකට පසුව නැවතත් එපරිද්දෙන්ම ඔහු අනුරාධපුරයට ගමන් කිරීමට අවශ්‍ය බව පවසමින් මුදල් එකතු කිරීමට උත්සාහ කල අවස්ථාවේ දී රියදුරු විසින් බැන වැදුණා.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා ඉදිරිපත් කල අදහස නොතේරුණු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

(iv). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා අදහස් දක්වමින්,
තෝරවෙලකන්ද මාර්ගය පළාත් සභා මාර්ගයක් ලෙස නම් කිරීමට අවශ්‍ය පියවර ගනිමු.

(v). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, දෙවටගේ ධර්මදාස මැතිතුමා අදහස් දක්වමින්,
පින්නවල සිට උදේ පාන්දර කොළඹ දක්වා ගමන් කරන බස් රථය පුදුකාටුව මංසන්ධියේ සිට ගමන් අරාම්භ කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස නැවත ශ්‍රී ලංගම ඩිපෝ කළමණාකරු වෙත දන්වා යවමු.

(vi). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා අදහස් දක්වමින්,
නෙල්ලිවල මාර්ගයේ පැති බැම් ඉදි කිරීම පිළිබඳව අදාල අමාත්‍යාංශ දැනුවත් කිරීමට පියවර ගනිමු. එමෙන්ම පින්නවල මහජන පොළ නොපවත්වන බවට තොරතුරු ලැබෙමින් පවතින බැවින්, සතිපතා මහජන පොළ පවත්වාගෙන යාමට අවශ්‍ය පියවර ගනිමු.

(vii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා අදහස් දක්වමින්,
මාමල්ගහ මාර්ගය අබලන් වී ඇති බැවින්, කඩිනමින් මාර්ගය සංවර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කිරීමට පියවර ගනිමු.
අලුත්නුවර පතල් කැණීම් කටයුතු වලට බලංගොඩ, පින්නවල, පඹහින්න පොලිස් ස්ථාන මඟින් බාධා කිරීම් සිදු කරනවා. අලුත් අවුරුදු උත්සව සමය එළඹෙන බැවින් වට්ටි මඟින් මැණික් ගැරුම් කටයුතු කිරීමට අවස්ථාව ලබා දීමට පියවර ගනිමු.
අලුත්නුවර හංදිය අසල පක්ෂ නායක අනුර කුමාර මැතිතුමා පැමිණෙන බව ප්‍රකාශ කරමින් මාලිමා සලකුණෙන් ඡන්දය ඉල්ලුම්කරනු ලබන අපේක්ෂකයන් විසින් පක්ෂ කාර්යාලයක් පිහිටුවා වේදිකා ඉදිකිරීමට රු. 1000/- ක මුදලක් එකතු කරනවා. මුදල් සම්මාදම් කටයුතු මෙන්ම මෙම ක්‍රියාවලියත් සුදුසු ක්‍රියාවලියක් නොවෙයි. මේ පිළිබඳව පොලීසිය දැනුවත් කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා අදහස් දක්වමින්,

දේශපාලන පක්ෂ හා දේශපාලන ක්‍රියාවලිය, සිදු වන්නේ ජනතාවගේ මුදලිනි. මහජන නියෝජිතවරුන් ලෙස අප සභාවේ කටයුතු සිදු කරන්නේ මහජන මුදල් මඟිනි. අනෙක් අයටත් ඉදිරිපත් කරන්න චෝදනා තිබෙනවා. ගරු සභාපතිතුමා හා මා අතර පෞද්ගලික හිතවත්කම් තිබෙනවා. ගරු සභාපතිතුමාට මාගේ විශේෂ ස්තූතිය පිරිනමමි.

(viii). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින්,
ජ.වි.පෙ. විසින් පසුගිය කාලයේ දී වැව් දහසක් සංවර්ධනය කිරිමේ ව්‍යාපෘතිය වෙනුවෙන් මුදල් අය කළා. අපේ ගෙවල් මංකොල්ල කෑම සිදු වුණා.
එම ප්‍රකාශයත් සමඟ ඊට අදාල තොරතුරු සම්බන්ධයෙන් පොලිසියට පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලෙසට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින්,
ට්‍රාන්ස්ෆෝමර් ගිනි තැබීම සුළු වරදක් ද?

(ix). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා අදහස් දක්වමින්,
අලුත් අවුරුදු උත්සවසමය එළෙඹන බැවින් ගැරුම් වට්ටිය මඟින් මැණික් පතල් කර්මාන්තයේ නියැලීමට සහයෝගය ලබා දීමට පියවර ගනිමු. නව මන්ත්‍රීවරයෙක් ලෙස සභාව නියෝජනය කල අවස්ථාවේ සිට අවසානය දක්වා ගරු සභාපතිතුමා ලේකම්තුමිය දැක්වූ සහයෝගයට විශේෂ ස්තූතිය පිරිනමමි

(x). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා අදහස් දක්වමින්,
වසර 77 ක් තුල රට පාලනය කළ පක්ෂ විසින් රට බංකොළොත් කළ බව ජ.වි.පෙ.ප කියනවා. 1980 ගණන් වලට වඩා අද රට දියුණු වෙලා. මාර්ග, පාසල් පද්ධතිය, පන්සල්, ආදි සෑම ක්ෂේත්‍රයක්ම සංවර්ධනය කිරිමට අප පක්ෂයට හැකි වුණා. මෑත කාලයේ බස් ගිනි තැබීම, ගෙවන් ගිනි තැබීම් ඔබතුමාලා කළා. නමුත් මේ පක්ෂ දෙකෙන් තමයි පාරවල් හැදුවේ. මට අවුරුදු නවයේ දී මගේ පියා මරා දැමුවා. මගේ පියාගේ ජීවිතය නැවත ලබා ගන්න පුළුවන්ද? ඔබතුමාලාට සදාචාරාත්මක අයිතියක් නැහැ මේ පිළිබඳව කතා කරන්න.

එම අවස්ථාවේ දී, මේ තරමට හොඳට තිබුණු රටක් නම් ජ.වි.පෙ. නමින් පක්ෂයක් බිහි වෙන්න අවශ්‍ය නැහැ. ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ මහජන නියෝජිතවරු ලෙස අප කිහිප දෙනා පමණක් මේ පිළිබඳව අදහස් ඉදිරිපත් කර කාළකණ්නි සතුටක් ලබන්න අවශ්‍ය නැහැ. සභාව ගිනි තැබුවා කීවාට කිසිම නඩුවත් ඉදිරිපත් කර නොමැති බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින්,
තිස්සමහාරාමය ප්‍රාදේශීය සභාව ජ.වි.පෙ. පක්ෂයට භාර දුන්නාට පවත්වාගෙන ගියාද?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, දෙවටගේ ධර්මදාස මැතිතුමා අදහස් දක්වමින්,
ඔවා දෙනු පරහට තමා සම්මතයේ පිහිටා සිට. තමා නිවැරදිව සිටිය යුතුයි අනෙක් අයට උපදෙස් දීම සඳහා. චන්ද්‍රිකා මැතිතුමිය, රනිල් වික්‍රමසිංහ මැතිතුමා, මහින්ද රාජපක්ෂ මැතිතුමා ආණ්ඩු කාලයන් පිළිබඳව චෝදනා කිරිම පමණක් ජ.වි.පෙ.ප විසින් සිදු කලා.

(xi). ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා අදහස් දක්වමින්,
අවසාන සභාව නිසා මේ ගැන ප්‍රකාශ කල යුතුමයි. මෙතුමා හැමදාම කලේ චෝදනා කරන එක පමණයි. මැතිවරණය කවදා තිබ්බත් ජනතාව ඡන්දය ප්‍රකාශ කරන්නේ කාටද යන වග ජනතාව විසින් තීරණය කල යුතුයි. අපිට චෝදනා කරමින් මොවුන් සූදානම් වෙලා. 1988,1989 වර්ෂ වලදී වනචාරී දේශපාලනයක් කළා. මගේ නිවස ඉදිරිපිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ගිනි තැබුවෙත් මොවුන්ගේ පක්ෂයේ අයයි. සභා ගර්භය ඉදි කිරිමට ගත් උත්සහය පිළිබඳව ගරු සභාපතිතුමාට විශේෂ ස්තූතියක් පිරිනමමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා අදහස් දක්වමින්,

කොන්ද කෙළින් තබාගෙන මන්ත්‍රීවරයෙක් ලෙස කටයුතු කිරිමට අවස්ථාව සකසා දීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාට විශේෂ ස්තූතිය පිරිනමමි. මහජන නියෝජිතවරයෙක් ලෙස සභාවට තේරී පත්වූ තෙවන අවස්ථාව මෙය බවද ප්‍රකාශ කරන ලදී.

ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා අදහස් දක්මින්,
මාහට දැක් වූ සහයෝගයට ලේකම්තුමියට, කාර්ය මණ්ඩලයට ගරු සභාපතිතුමාට, පක්ෂ විපක්ෂ සියලු දෙනාට ස්තූතිය පිරිනමමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය
අමුවත්තට බස් රථයක් ධාවනයේ යොදවන ලෙසට ඩිපෝ කළමණාකරු දැනුවත් කිරිමට පියවර ගනිමු. විපක්ෂ මහජන නියෝජිතයන් ලෙස නියෝජනය කලත් අවශ්‍යා සෑම අවස්ථාවකදී ම සහයෝගය අපි ලබා දුන්නා. ගරු සභාපතිතුමා ඇතුළු ඔබ සියලු දෙනාට ස්තූතිය පුද කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, ඒ.පී. එමරෙන්සියා මේරි මැතිතුමිය අදහස් දක්වමින්,
දමිළ මන්ත්‍රීවරියක් ලෙස තේරී පත්ව වසර 05 ක කාලයක් සියලුම පක්ෂ නියෝජිතයන් සමඟ සහෝදරත්වයෙන් සිටියා. අද දින අවසන් සභාව බැවින් ඒ පිළිබඳව ලොකු වේදනාවක් තිබෙනවා. ගරු සභාපතිතුමා ඉතාම සහයෝගයෙන් අප සමඟ කටයුතු කළා. මෙම කාලය තුල කුමන හෝ වරදක් සිදු වූවා නම් ඒ සම්බන්ධයෙන් සමාව ඉල්ලා සිටින අතර ගරු සභාපතිතුමාට විශේෂ ස්තූතියක් පුද කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා අදහස් දක්වමින්,
යෝධ සෙවනැල්ලක් ලෙස ජනතාව තුල නිහතමානී ගෞරවය ඇති කල ගරු සභාපතිතුමනි, ඔබතුමාට විශේෂ ස්තූතිය පිරිනමමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින්,
මහජන නියෝජිතවරු ලෙස සභාවට පය තැබූ අවස්ථාවේ සිට ඉදිරිපත් සියලු යෝජනා සඳහා ඔබතුමාගේ පූර්ණ සහයෝගය දැක්වීම සම්බන්ධයෙන් විශේෂ ස්තූතිය පිරිනමමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, මුනියන්ඩි මල්ලිකා දේවි මැතිතුමිය අදහස් දක්වමින්,
සභා කටයුතු වලදී සහයෝගය දැක්වීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාට විශේෂ ස්තූතිය පිරිනමමි. එමෙන්ම ආරුමුගම් තොණ්ඩමන් මැතිතුමාට ද විශේෂ ස්තූතිය පිරිනමමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා අදහස් දක්වමින්,
ඉතාමත් දක්ෂ සභාපතිවරයෙක් යටතේ ප්‍රාදේශීය සභාවේ මහජන නියෝජිතවරයෙක් ලෙස වසර 05 ක කාලයක් නියෝජනය කිරිමට හැකිවීම සම්බන්ධයෙන් ඉතාමත් සතුටට පත්වන අතර ම, එතුමා දැක්වූ සහයෝගය සම්බන්ධයෙන් විශේෂ ස්තූතිය පිරිනමමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා අදහස් දක්වමින්,
හිටපු සභාපතිවරුන්ගේ කාලය තුල සහ වත්මන් සභාපතිවරයාගේ ධූර කාලය තුල පැහැදිලි වෙනසක් දුටු අතර කොරෝනා වසංගත තත්ත්වය ඇති නොවුණා නම් ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ විශාල සංවර්ධනයක් සිදු වෙනවා. ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනාටත් ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් ස්තූතිය පිරිනමමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය අදහස් දක්වමින්,
රත්මලවින්න කොට්ඨාසය වෙනුවෙන් සංවර්ධන ක්‍රියා සිදුකලා. රත්මලවින්න ක්‍රීඩාපිටිය සංවර්ධනය කලා. වෙලන්හින්න ට්‍රාන්ස්ෆෝමරය නවීකරණය කළා. රත්මලවින්න පාසල ජාතික පාසලක් වශයෙන් නම් කිරිමට අවශ්‍යා කටයුතු සිදු කළා. කර්යශූර සභාපතිවරයෙක් ලෙස දැක්වූ සහයෝගය සම්බන්ධයෙන් විශේෂ ස්තූතිය පිරිනමමි. නිරංජලා මන්ත්‍රීතුමියටත්, ලේකම්තුමිය ඇතුළු නිලධාරි මණ්ඩලයටත් මාධ්‍යවේදී මහත්වරුන්ටත් ස්තූතිය පුද කරමි.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වීම අනුව,
වැඩිහිටි දිමනාව නැවත වාරයක් තැපැල් කාර්යාල ඔස්සේ ලබා දීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත දන්වා යැවීමට පියවර ගනිමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමාගේ සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා අදහස් දක්වීම අනුව,
සම්මාදම් ව්‍යාපාර දෙකම කැට හා ලෙඩ පක්ෂ වෙනුවෙන් අරමුදල් එකතු කරන බව පොලීසියට දැනුවත් කිරිමට හැකියාව තිබෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා අදහස් දක්වීම අනුව,
තෝරවෙලකන්ද මාර්ගය පළාත් මාර්ගයක් ලෙස නම් කිරීමට මාර්ග අමාත්‍යාංශය දැනුවත් කිරීමට පියවර ගනිමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, දෙවටගේ ධර්මදාස මැතිතුමා අදහස් දක්වීම අනුව,
කොළඹ දක්වා දිවෙන බස් රථය සහා පරිපාලන ප්‍රදේශයෙන් පිට ධාවනය වන නිසා ක්‍රියාත්මක කරවා ගැනීමට නොහැකි වී ඇතත් ඩිපෝ කළමණාකරු දැනුවත් කිරිමට පියවර ගනිමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා අදහස් දක්වීම අනුව,
නෙල්ලිවල මාර්ගයේ පැතිබැම්ම ඉදි කරවා ගැනීම පිළිබඳව අකිල එල්ලාවල මැතිතුමා දැනුවත් කරමු.
පින්නවල මහජන පොළ සඳහා වෙළෙන්දන් පැමිණෙන්නේ අඩුවෙන් වුවත්, පොළ පවත්වාගැනීම සඳහා ප්‍රචාරක කටයුත්තක් සිදු කිරිමට පියවර ගනිමු.

අමුවත්ත මාර්ගයට බස් රථයක් ධාවනයේ යොදවන ලෙසට ඩිපෝ කළමණාකරු දැනුවත් කරමු.

පතල් කර්මාන්තය සම්බන්ධයෙන් අවුරුදු සමයේ දී දිස්ත්‍රික් සම්බන්ධිකරණය සහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ විසින් මෙවැනි සහන මීට පෙර ලබා දී තිබෙනවා. ප්‍රාදේශීය සම්බන්ධීකරණයට මේ පිළිබඳව ඉදිරිපත් කරමු.

ජ.වි.පෙ. හැමදාම චෝදනා කරනවා මුදල් හොරකම් කලා කියලා නඩු දාන්න කිව්වට කරන්නේ නැහැ. කප්පම් වසන්ත කියලා අනුරාධපුරේ ජ.වි.පෙ. ඡන්දය ඉල්ලන කෙනෙක් ඉන්නවා. වැව් දහසක් සම්බන්දයෙන් කතා කළා. සියලු දේ අප පක්ෂ වලට පමණක් වලංගු නැහැ. ඔබ සැමටත් ඒවා වලංගුයි. සියලුම කර්මාන්ත කඩා වැටී තිබිය දී යන්තම් හරි පවත්වාගෙන ගියේ පතල් කර්මාන්තය පමණි.

සමනල වැවට යටවුණු ඉඩම් ලබා දෙන අවස්ථාවේ දී සභාවටත් ඉඩම් කොටසක් ලැබුණා. නමුත් ලියවිලි නැහැ.
2023/03/19 වෙනි දින විසුරුවා හැරියොත් ඉදිරි කාර්යාල කටයුතු සඳහා මා විසින් කිසිදු ආකාරයකට අතපෙවීමක් සිදු කරන්නේ නැහැ. පින්නවල නගර ව්‍යාපෘතියට ප්‍රමුඛ ස්ථානයක් ලබා දෙන්න කියලා. අවුරුදු පහක් තිස්සේ එක් මතයක සිටිමින් සභා කටයුතු පවත්වාගෙන යාමට සහයෝගය ලබා දුන් පක්ෂ විපක්ෂ සියලු දෙනාටම විශේෂ ස්තුතිය පිරිනමමි.

## (09). මී ළඟ සභා වාරයට දින නියම කිරීම.

2023 වර්ෂයේ අප්‍රේල් මස 11 වෙනි අඟහරුවාදා දින ඊළඟ සභාවාරය පැවැත්වීමට කටයුතු කරනවා.

(10). ස්තූති කතාව හා අවසානය.

හත්වන සභාවේ හැටඑක්වන සභාව සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාටත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ නිලධාරින් සියළු දෙනාටත්, මාධ්‍යවේදී මහතුන් සියළු දෙනාටත්, මාගේ ගෞරවනීය ස්තූතිය පුද කරමි.

ඉන් අනතුරුව, පෙ.ව. 12.30 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් විය.

එස්. ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත්,
සභාපති,
ඉඹුල්පේ ප්‍රාදේශීය